මගේ අංකය - ඕ5 /සැරයන්/විභාග/2024
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2026.02. 11

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරට උසස් කිරීම සඳහා වන ලිඛිත තරඟ විභාගය - 2026**

මෙම දෙපාර්තමේන්තුවේ පවතින බන්ධනාගාර සැරයන් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2024.12.31 දිනට පහත සඳහන් සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් (කාන්තා/පිරිමි) අයදුම්පත් කැඳවනු ලැබේ. සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 33.33% ක් මෙමඟින් සම්පූර්ණ කරනු ලබන අතර, ඒ අනුව පිරිමි තනතුරු 113 ක් හා කාන්තා තනතුරු 06 ක් බඳවා ගැනීමට නියමිතය.තෝරා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ජූනි මස කොළඹදී පවත්වනු ඇත.

- අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services"යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 පෙබරවාරි මස 25 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 මාර්තු මස 25 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.

- නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව අයදුම්පතෙහි සහතික කරන ලද පිටපතක් බන්ධනාගාර මූලස්ථානය වෙතද ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**02.** මේ බව නිලධාරීන්ට දන්වා අවශ්‍ය කටයුතු කරන්න.

**03.**

1. **වැටුප් ක්‍රමය** - 54000 -9X 670 - 17X890 -75160 (RS-2-2025 PS)

2. **කාර්යක්ෂමතා කඩඉම** - පත්වීම් ලැබ වසර 03ක් ඇතුළත සමත් විය යුතුය.

3. **සපුරාලිය යුතු මූලික සුදුසුකම්:**

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට (2024.12.31) නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
iii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
iv. සුදුසුකම් ලබන දිනට (2024.12.31) පූර්වාසන්නතම වසර (08) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම. (රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/04/2021 හා 2023.04.12 දිනැති ලිපිය අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වන දින වනවිටවත් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර තිබිය යුතුය.)
vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

4. **සතුටුදායක සේවා කාලයක් යනු :**
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ඡේදයේ 236 (I) වගන්තිය අනුව නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතූන් මත අත්හිටුවා හෝ අඩු කොට හෝ නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද, වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු බවට නිගමනය කර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද, සහ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු බවට නිගමනය කර ඇති විටෙක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ඡේදයේ 236 (II) වගන්තිය අනුව ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට වසර පහ(05)ක කාල සීමාවක් ද, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛන යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට වසර දෙකක(02)ක කාලසීමාවක් ද ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25.2 වන වගන්තිය යටතේ දක්වා ඇති ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනය දඬුවමක් ලබා ඇති නිලධාරියෙකු එම වරද සිදුකළ දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ද ගතවනතුරු බඳවාගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් අනුව සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමට හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබාදෙනු ලබන ශ්‍රේණි උසස්වීමකට හෝ නුසුදුසු නිලධාරියෙකු ලෙස සැලකිය යුතු වන්නේය.

5. **උසස් කිරීමේ ක්‍රමය :** විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් විභාගයේදී ඉහළම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ අනුව අවශ්‍ය මූලික සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරෙන අතර, එමඟින් මූලික සුදුසුකම් සපුරන නියාමක නිලධාරීන් පමණක් ( ඉහත අංක III හි දක්වා ඇති පරිදි) සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. මෙමඟින් පවතින පුරප්පාඩුවලින් 33.33% ක් සම්පූර්ණ කරනු ලැබේ.

6. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් වන අතර, ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7. **විභාග ගාස්තු**
   - ❖ විභාග ගාස්තුව රු.600/-කි. විභාග ගාස්තුව ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

      i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
      ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
      iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
      iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ). ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ). ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තුව අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ). විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

8. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් භාරගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකිවන පරිදි මුහුණ ආවරණ කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. විභාග විෂය නිර්දේශය :

| විෂය අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | සියලුම වගන්ති | පැය 02 | 100% | 40% |
| 02 | මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් (සාමාන්‍ය දැනීම අපේක්ෂා කරයි) | • මානව හිමිකම් ඉතිහාසය සහ එහි වර්ධනය<br>• මූලික අයිතිවාසිකම් හා ශ්‍රී ලංකාව තුළ එහි ක්‍රියාකාරීත්වය<br>• සිරකරුවන් සම්බන්ධව අවම පහසුකම් සැලසීම පිළිබඳ එක්සත් ජාතික සංවිධානය මගින් නිකුත් කර ඇති ප්‍රමිතීන් (රීතීන්) | පැය 01 | 100% | 40% |

- ප්‍රශ්න පත්‍ර බහුවරණ, කෙටි ලිඛිත හා අර්ධ ව්‍යූහගත ප්‍රශ්නවලින් සමන්විත වේ.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම , ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී /සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

12. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම ආයතන ප්‍රධානියා ලවා අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

14. පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබාගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත්වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exam.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.